# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/69 - 2017 පෙබරවාරි මස 03 වැනි සිකුරාදා - 2017.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 8/3/5/3/6.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2013/WS/693.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොහොන්සිය පත්තුව සුළු කොට්ඨාසයේ, කළුදැවල කොට්ඨාස අංක 2 මන්දණ්ඩාවල (මාතලේ මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක මා/1688 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1064 ක් වූ ඉඩම් කොටස සඳහා මායිම් :

**කැබලි අංක 1 - කලුදැවල වත්ත, මුල් හිමිකම : අබ්දුල් සත්තාර් මොහොමඩ් වසීර්.**

*උතුරට* : මාර්ගය සහ මූ.පි.මා. 383 හි කැබලි අංක 1; *නැගෙනහිරට* : මූ.පි.මා. 383 හි කැබලි අංක 1 සහ මාර්ගය; *දකුණට* : මාර්ගය සහ අබ්දුල් සත්තාර් මොහොමඩ් වසීර් හිමිකම් කියන කලුදැවල වත්ත (හි.පි. 50252); *බටහිරට* : අබ්දුල් සත්තාර් මොහොමඩ් වසීර් හිමිකම් කියන කලුදැවල වත්ත (හි.පි. 50252) සහ මාර්ගය;

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 මාර්තු මස 29 වැනි දින ප.ව. 2.00 ට මාතලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද, 2017 මාර්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ.

2017 ජනවාරි මස 31 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 761

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : නුඑ/3/1/8/අත්/111/35.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2009/CEB/62.

අංක 1881/12 හා 2014.09.23 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ සිංහල භාෂාවේ 01ඒ පිටුවේ අනු අංක 02ට අදාළ කැබලි අංක 02 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.0095 වෙනුවට හෙක්ටයාර් 0.0995 ලෙස මෙයින් සංශෝධනය කරමි.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2017 ජනවාරි මස 30 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 762

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රා. ලේ. ගොණු අංකය* : ඩීඑස්බී/එල්/1/2/47.
*ඉඩම් අමාත්‍යාංශ ගොණු අංකය* : 03ජේ/80ඊ/205.

අංක 283/16 හා 1984 පෙබරවාරි 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ වන පහත විස්තරයනට අදාළ දැන්වීම.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තරය.*

පිහිටීම :- රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුවග්ගම්පත්තුවේ දූරගෙකන්ද යන්න දූරකන්ද ගම ලෙස සංශෝධනය විය යුතු ය.

සැලැස්මේ අංකය :- අ.ග.පි. 191 අතිරේක 1 යන්න අ.ග.පි. 491 අතිරේක 01 පත්‍ර අංක 01 ලෙස සංශෝධනය විය යුතු ය.

ඉඩමේ නම :- රුක්අත්තනගහවත්ත

හිමිකම් කියන අය :- ඩබ්. අමුනේරිස් යන්න කන්දෙගෙදර වතුකාරගේ අවුනේරිස් දූරකන්ද, රාස්සගල, බළන්ගොඩ යන්න සංශෝධනය විය යුතු ය.

ප්‍රමාණය :- හෙක්ටයාර් 0. 504

ඉහත නම් සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 1984 අප්‍රේල් මස 06 වැනි දින පෙ.ව. 10.00 ට බලන්ගොඩ ප්‍රා.උ.දි. කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය යන්න 2017 මාර්තු මස 01 වැනි දින පෙ.ව. 10.00ට බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය යන්න සංශෝධනය විය යුතුය හා

තවද, 1984 මාර්තු මස 28 වැනි දිනට මත්තෙන් යන්න 2017 පෙබරවාරි 22 වැනි දිනට මත්තෙන් යන්න සංශෝධනය විය යුතු අතර එදිනට මත්තෙන් එම ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එම ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

චම්පික නිරෝෂ් ධර්මපාල,
ප්‍රාදේශීය ලේකම්,
බළන්ගොඩ.

2017 ක් වූ ජනවාරි මස 30 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 763

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.